# ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික-සංකල්පීය ගැටලු පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය ටියුඩර් වීරසිංහ

ශ්‍රී ලංකාවේ පමණක් නොව බොහෝ සංවර්ධනයවෙමින් පවතින රටවල සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද ක්ෂේත්‍රයේ න්‍යායික සංකල්පීය අංශය පමණක් නොව එහි ප්‍රායෝගික අංශයද බිහි වී වර්ධනය වන්නට වූයේ බටහිර ලෝකය සමග වූ අන්තර්ක්‍රියාකාරීත්වය සහ බලපෑම තුළ බව ප්‍රකටය. සංවර්ධනයවෙමින් පවතින රටවල පොදු තත්ත්වය හැඩගැසෙන්නට වූයේ 17 සහ 19 වන සියවස් තුළ යුරෝපීය රටවල වර්ධනය වූ කාර්මික සහ ආර්ථික නැගීමේ සහ යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් වශයෙනි. කාල් මාක්ස්ට අනුව යටත්විජිත ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය ඉතිහාසයේ ප්‍රාදේශීය ස්වරූපය නිමාවට පත් කළ අතර එය ලෝක ඉතිහාසයක් බවට පත්විය.[1] මේ සංවර්ධනය වන රටවල පොදු තත්ත්වය හැඩගැසුණේ ලෝක ධනේශ්වර පද්ධතියේ අවියෝජනීය කොටසක් ලෙසය. මෙය 19 සහ 20 වන සියවස් සීමාව තුළ සිදුවූ අතර එය ඒ රටවල අනාගත ඉරණම කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයක් බවට පමණක් නොව ලෝක ඉතිහාසයේ ගමන් මග කෙරෙහි බලපාන ලද ප්‍රබල



සාධකයක් බවටද පත්විය.

එසේම සංවර්ධනයවෙමින් පවතින රටවල සංස්කෘතික සහ විද්‍යාත්මක චින්තනය හැඩගැසීමේ ක්‍රියාවලියද ද්විත්ව ස්වරූපයකින් ගත් බව පෙන්වා දිය යුතුය. එක් අතකින් පාරිවාරික යථාර්ථය පාදක කොටගෙන නිර්මාණය වූ පාරිවාරික විඥානයද අනෙක් අතින් අදාළ රටවල ස්වදේශීය යථාර්ථය පාදක කොටගෙන නිර්මාණය වූ ස්වවිඥානයද පසුකාලීනව එම රටවල සමාජ, දේශපාලන, සංස්කෘතික, විද්‍යාත්මක වර්ධනයේ විශේෂතා කෙරෙහි තීරණාත්මක ලෙස බලපාන ලදී. පාරිවාරික විඥානය යටත්විජිතවාදය සමගම බිහිවූ අතර ස්වවිඥානය යටත්විජිතවාදයට එරෙහි අරගලය තුළ වර්ධනය වූ බව පෙනේ. පාරිවාරික විඥානය ශිෂ්ටාචාරික, ආගමික-ආලෝකන අදහස්වල ස්වරූපයෙන් ක්‍රියාත්මක වන අතර එම අදහස්, සංකල්ප මතවාද වර්තමානයේදීද ශ්‍රී ලංකාව වැනි පශ්චාත් යටත්විජිත සමාජවල ක්‍රියාත්මක වන්නේය. එසේම මේ මාර්ගයේ විඥාන ස්වරූපය තුළ ප්‍රාග් යටත්විජිත ගතානුගතික සංඝටකද අන්තර්ගතව පවතින්නේය. මෙම ලෝක සංවේදනය සමහරවිට පාරිවාරික විඥානයේ කොටසක් බවට හෝ ස්වවිඥානය නිර්මාණය වී නම් කොටසක් බවට හෝ පරිවර්තනය විය හැකිය. ඒ අනුව එය පවිත්‍ර ලෙස පරම ලෙස සාම්ප්‍රදායික විඥානය ලෙස ක්‍රියාත්මකවීමට අසමත්වන්නේය. එය ව්‍යාජ සාම්ප්‍රදායික හෝ අර්ධ සාම්ප්‍රදායික හෝ ස්වරූපයකට පත්වන්නේය. නමුත් බාහිරින් පැමිණියත් මේ පාරිවාරික විඥානය යම් කෘත්‍රිම විඥානයක් නොවන බව අවධාරණය කළ යුතුය. මෙම පාරිවාරික විඥාන සංවර්ධනය වන සෑම රටකම වාගේ ප්‍රතිනිෂ්පාදනයවෙමින් සුරක්ෂිතව පවතින්නේ අසමාන වූ තත්ත්වයන් මතය. මේ පාරිවාරික විඥානය බොහෝ විට බටහිර රටවල සිදුවන විද්‍යාත්මක, තාක්ෂණික, සංස්කෘතික සහ දෘෂ්ටිවාදී සොයාගැනීම් සහ වර්ධනයන් සංවර්ධනයවෙමින් පවතින රටවල ප්‍රබුද්ධ ප්‍රජාවේ න්‍යායික සහ සංකල්පීය සැකැස්ම නිර්මිත කරන්නේය. මෙහිදී විශේෂයෙන්ම අවධාරණය කළයුත්තේ ධනේශ්වර කේන්ද්‍රීය රටවල විද්‍යා-තාක්ෂණික විප්ලවයේ ආභාසය සංවර්ධනයවෙමින් පවතින රටවල ප්‍රබුද්ධ ප්‍රජාවට

සම්බන්ධවන්නේ අසංවර්ධිත, අවිධිමත් නව ලිබරල් වෙළෙඳපොළ සන්දර්භයක් තුළ සහ ව්‍යාජ සාම්ප්‍රදායික විධානික සැකැස්මක් තුළ බවයි. මේ තත්ත්වය තුළ පාරිවාරික විධානයෙහි අභේද්‍යනීය ගතිලක්ෂණයන් වන ආකෘතිකත්වය සහ අනුකාරකත්වය උත්කර්ෂණය වන්නේය. විශේෂයෙන්ම මෙහිදී අපට වැදගත් වන්නේ එම තත්ත්වය මානව සහ සමාජ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ න්‍යායික සහ සංකල්පීය සැකැස්ම තුළ වර්ධනයවීමයි. මේ අනුව පෙනීයන්නේ පාරිවාරික විධානය ඊට ගැළපෙන්නා වූ මානව සහ සමාජ විද්‍යාත්මක න්‍යායික සහ සංකල්පීය සැකැස්මක් හැඩගස්වනු ලබන බවයි. එනම් යුරෝපීය ඥාන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ නිෂ්පාදිත න්‍යායික සහ සංකල්පීය පද්ධති පාරිවාරික යථාර්ථය තුළ යම් යම් විකරණයන්ට ලක් කරන්නේය.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මානව සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ න්‍යායික සහ සංකල්පීය ඌන සංවර්ධිතභාවය, සාවද්‍ය අර්ථාරෝපණභාවය, අවිනිශ්චිතභාවය, ව්‍යාජ අර්ථකථන ආදියට අප ඉහත ගෙන හැර දක්වන ලද සාධක පාදක වී ඇති අතර ඊට අමතරව දැඩි සදාචාරාත්මකභාවය, දැඩි ආගමිකභාවය එසේම දෘෂ්ටිවාදී බහුආංශිකභාවය පන්න සහ පන්ති සම්බන්ධතාවල ඌන සංවර්ධනය සහ විශේෂයෙන්ම සුවිශේෂ සමූහන විධානයක් පැවැත්ම සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ සමාජ ජීවිතයේ දෘෂ්ටිවාදී නිර්මිතීන්ගේ මූලික ලක්ෂණයක් ලෙස ගෙනහැර දැක්විය හැක්කේ එහි සංකර, විචිත්‍ර ස්වභාවය. එකිනෙකට සංයෝජනය කළ නොහැකි මූලධර්ම පවා සැබෑ ජීවිතයේදී සංගතවීමක් අත්දැකිය හැකිය. සාම්ප්‍රදායිකවාදය සහ නූතනවාදය, උන්මූලවාදය (රැඩිකල්වාදය) සහ ගතානුගතිකවාදය, ධනවාදය සහ සමාජවාදය, ජාතිවාදය සහ ජාතිකවාදය නිදර්ශන වශයෙන් දැක්විය හැකිය. 1970 ගණන්වලදී මෙම ප්‍රතිවිරෝධීය ප්‍රවණතා සංශ්ලේෂීය අභිනතියක් ඔස්සේ වර්ධනයවීමේ ප්‍රයත්නයක් නිරීක්ෂණය වන්නට විය. පශ්චාත් යටත්විජිතවාදී ශ්‍රී ලංකාවේ මේ කාලය සංක්‍රාන්තික සහ බහුආංශික ස්වරූපයක් පෙන්නුම් කළ අතර සමාජ විධානය සහ චින්තනය තුළ දෙමුහුන්, සංකර, සංගත සහ සාරසංග්‍රහවාදී ගතිලක්ෂණ



ආධිපත්‍යය දැරීය. චින්තන මාදිලිය සාම්ප්‍රදායිකත්වය සහ නූතනත්වය අතර කේන්ද්‍රගත වූ අතර විධානයේ ගතිකත්වය බොහෝදුරට තීරණය වූයේ බාහිර බලවේගවලට අනුකූලවය. එසේම අධෝව්‍යුහයට වඩා උපරිව්‍යුහයේ නිර්ධාරක බලපෑම ප්‍රබල විය.[1] මෙම ක්‍රියාවලියේ මූලික කර්තෘකයන් ලෙස ඉදිරිපත් වූයේ ජාතිය, ගොවියෝ, සුළු ධනේශ්වරය, මධ්‍යම පන්තිය සහ ඊට සමීප සමාජ පන්ති සහ ස්ථිර සහ වර්ධනයවෙමින් පැවති කම්කරු පන්තිය සහ ධනේශ්වර පන්තියන්ය. මෙහිදී ව්‍යුහාත්මකව සමාජ විධානයේ සහ චින්තනයේ වර්ධනය විමසා බලන ලද්දේ සාම්ප්‍රදායිකත්වය සහ නූතනත්වයත්, ජාතිකත්වය සහ යටත්විජිත තත්ත්වයත් අතර අරගලයේ ප්‍රිස්මය තුළිනි. ජාතිකත්වයේ සහ යටත්විජිත තත්ත්වයේ සංශ්ලේෂණය තුළ ක්‍රියාවලියේ වර්ධනය දුටු අතර එකිනෙකා අතර පවත්නා අන්‍යෝන්‍ය වාසිදායක සම්බන්ධතාව සහ සමාකර්ෂණය තුළ සංවර්ධනය අර්ථ දක්වන ලදී.

සංවර්ධනයවෙමින් පවතින රටවල සමාජ, දේශපාලන, සංස්කෘතික තත්ත්වයන් ප්‍රජනනය කරගැනීම එම සමාජයන්හි ස්වවිධානය හැඩගැසීමත් සමගම සිදුවිය. එම රටවල ස්වවිධානය වඩාත් පරිණතවීමට සාපේක්ෂව එහි විද්‍යාත්මක චින්තනයද වඩාත් වර්ධනය වන්නට විය. විශේෂයෙන්ම මෙම ඍජු සහ ද්විපාර්ශ්වික සම්බන්ධතාව සමාජ-මානව විද්‍යා ක්ෂේත්‍රයෙහි න්‍යායික චින්තනය වර්ධනය වීම කෙරෙහි බලපෑවේය. එම වර්ධනයන් විද්‍යාත්මක ප්‍රජනනයේ ශෛලිය සහ සංවර්ධනයවෙමින් පවතින සමාජවල හරයේ සහ එම රටවල විශේෂතා සහ නියමානුකූලතා පිළිබඳව තිබූ න්‍යායික හා සංකල්පීය ආකල්පයේ අන්තර්ගතය වෙනස්වීම කෙරෙහි බලපෑවේය. යටත්විජිතවාදය විසින් විකෘති කරන ලද සංවර්ධනයවෙමින් පවතින රටවල යථාර්ථය සහ එහි පරිවාරීක චින්තනයේ ශෛලිය මැඩපැවැත්වීම සඳහා ක්‍රියාවලින් අවබෝධ කරගැනීමේ නව ප්‍රජානන ශෛලියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කර්තව්‍යයක් විය. ඒ අනුව මේ සමාජවල යථාර්ථය පිළිබඳව විචාරාත්මක සහ නිර්මාණාත්මක චින්තන ශෛලියකින් තොරව මේ රටවල ආධිපත්‍යය දරන පරිවාරීක සහ අනුකාරීක විධානය

සහ චින්තනය වෙනස් කළ නොහැකිය.

ශ්‍රී ලංකාවේ සමාජ-මානව විද්‍යා ක්ෂේත්‍රයේ භාවිත න්‍යායික සහ සංකල්පීය පරිගනයේ තාර්කික ස්වරූපයත්, එහි ප්‍රජානන ශක්‍යතාවත් යළි සලකා බැලීම කාලීන සහ ශාස්ත්‍රීය අවශ්‍යතාවක් බව පෙන්වා දිය යුතුය. මෙහිදී විශේෂයෙන් අපගේ අවධානය යොමුවන්නේ ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික සංකල්පීය ප්‍රදේශයේ දැනට භාවිත වන න්‍යායික සංකල්ප ගැටලු කීපයක් පිළිබඳව විමර්ශනය කිරීමය. මේ සම්බන්ධව මූලික කාරණා හතරක් වෙන්කර හඳුනා ගත යුතුය.

1. බටහිර කේන්ද්‍රීයව නිර්මාණය වූ පෙරදිග සමාජ ක්‍රමය නවීකරණය කිරීම කෙරෙහි යොමුවී ඇති ක්‍රමවේදිය ආකෘතිකවාදය, දෘෂ්ටිවාදී ගතානුගතිකවාදය සහ කෘත්‍යවාදී ඒකමානිකත්වය ආදිය පිළිබඳව විචාරාත්මකව ප්‍රතිසමාලෝචනය කිරීමේ ගැටලු.
2. ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ භාවිත න්‍යායික සහ සංකල්පීය පද්ධතියේ ඌන සංවර්ධිතභාවය, ඌන උපයෝජිතභාවය සහ ඊට සිදු කොට ඇති ව්‍යාජ අර්ථාරෝපණය පිළිබඳ ගැටලු.
3. ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික සහ සංකල්පීය ව්‍යුහය තාක්ෂණිකවාදී සහ ආකෘතිකවාදී රාමුවක් තුළ ගොඩනැගී තිබීමේ ගැටලු.
4. සමකාලීන බටහිරවාදී සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයනය සංවර්ධනය නොවීම සහ එහි ඓතිහාසික සීමා පිළිබඳ ගැටලු.

ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ පවතින මේ සමස්ත ගැටලු සංකීර්ණයම මෙම විෂය ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වී නම්, උත්තරාරෝපණය වීමේ සහ එහි ශාස්ත්‍රාලීය සම්ප්‍රදාය නියෝජනය කළ ප්‍රබුද්ධ ප්‍රජාවේ ඓතිහාසික සහ ශක්ෂණමය විශේෂතා සමග අවියෝජනීයව



සම්බන්ධ බව අවධාරණය කළ යුතුය.

මෙහි අප ගෙනහැර දක්වන ලද පළමු කාරණය අංග්ලො-ඇමරිකානු න්‍යායික සහ සංකල්පීය ආකෘතිය අවිචාරාත්මකව ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද ක්ෂේත්‍රයට ආරෝපණය කිරීම හා සම්බන්ධවන්නේය. මෙම බටහිරවාදී සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රමවේද සහ සංකල්ප විශ්වීය අභිනතියක් සහිත ගෝලීය නියමයන් ලෙස අප රටවල පිළිගැනීමට ලක්වීම අදාළ ක්ෂේත්‍රවල විචාරාත්මක සහ නිර්මාණාත්මක වර්ධනයන් වළකාලීමට හේතුවූ සාධකයක් විය. සමාජයෙහි පැවති සංහතික මාධ්‍ය සංස්කෘතියට සහ සමාජ සැකැස්මට සාපේක්ෂව මේ න්‍යායික සහ සංකල්පීය ආකෘති අකාර්යාත්මකවීම, ක්‍රියාකාරීත්වවාදයෙන් තොරවීම, සුලභ සත්‍ය බව, ද්විතියික ගැටලු කෙරෙහි යොමුවීම, එනම් අධ්‍යයනයට යොමුවූ යථාර්ථයේ වඩාත් වැදගත් පැතිකඩ මගහැරීම, විකෘති කිරීම, හරසුන් විශ්ලේෂණ එසේම අධිවියුක්තිකරණ සහ අධිආකෘතිකවාදය බහුලව දැකිය හැකිවිය.

දෙවන කාරණය සම්බන්ධව මෙය ශ්‍රී ලංකාවේ සංහතික මාධ්‍යවේද ක්‍රියාකාරීත්වය නියෝජනය කරන තල ත්‍රිත්වය තුළම දැකිය හැකි පොදු ලක්ෂණයක්වන්නේ ඊට අදාළ සංකල්පවල ඌන සංවර්ධිතභාවය සහ ඌන උපයෝජිතභාවය පිළිබඳ ගැටලුවයි. ශාස්ත්‍රාලීය තලය, වෘත්තීය තලය සහ සංහතික තලය එම තල ත්‍රිත්වය වන අතර ඒවා අන්‍යෝන්‍ය වශයෙන් සහසම්බන්ධිතව ක්‍රියාත්මක වේ. නිදර්ශනයක් වශයෙන් ශාස්ත්‍රීය තලය තුළ භාවිත කරනු ලබන 'ජන' යන සංකල්පය ගෙනහැර දැක්විය හැකිය. මේ 'ජන' යන සංකල්පය ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව ව්‍යවහාර වීම ආරම්භ වන්නේ 1970 දශකය ආරම්භයේදී බව පෙනේ. එනම් ශ්‍රී ලංකාව තුළ ජනසන්නිවේදන විෂයයක් වශයෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යයනය ආරම්භ වන කාලයේදීය. 1973දී කැලණිය විශ්වවිද්‍යාලයේදී සන්නිවේදනය විෂයයක් ලෙස අධ්‍යයනය ආරම්භ විය. නමුත් ජනසන්නිවේදනය පමණක් නොව 'සන්නිවේදනය' යන සංකල්පයද 70 දශකය ආරම්භයේදී පවා ශ්‍රී

ලංකාව තුළ භාවිත නොවිය. ශ්‍රී ලංකාවේ පුරවල් සාහිත්‍යයික හා සංස්කෘතික ප්‍රබෝධයත් සමග 1956දී ප්‍රකාශයට පත්වී ඇති ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේද සන්නිවේදනය හෝ ජනසන්නිවේදනය යන සංකල්ප ඇතුළත් නොවේ. 'සන්නිවේදනය යනු හැත්තෑව දශකය ආරම්භයේදී ලාංකීය සමාජය තුළ භාවිත වචනයක් නොවේ.'[9]

ශ්‍රී ලංකාව තුළ ජනසන්නිවේදන අධ්‍යයන පාඨමාලා බිහිවන්නේ එවකට පැවති විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පොදු අර්බුදයක ප්‍රතිඵලයක් වශයෙනි. 1971 කැරැල්ල උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව තවත් තහවුරු කළ අතර ඊට ප්‍රතිචාර ලෙස වෘත්තියාභිමුඛ පාඨමාලා ඇති කිරීමේ ප්‍රතිපත්තිය යටතේ ජනසන්නිවේදන පාඨමාලාද බිහිවූ බව පෙන්වා දිය යුතුය. මෙම දේශපාලනික සහ පරිපාලනික සාධක ද ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයනයේ සංකල්පීය සහ න්‍යායික ව්‍යුහය සකස්වීමෙහිලා බලපා ඇති බව සිතිය හැක.

යුරෝපීය රටවල සන්නිවේදනය සහ සංහතික මාධ්‍ය අධ්‍යයන පාඨමාලා ආරම්භවන්නේ දේශපාලනික හෝ පරිපාලනික මැදිහත්වීම්වල වඩා සමාජ-සංස්කෘතික සහ විශේෂයෙන්ම නව සමාජ සැකැස්මක් වශයෙන් සංහතික ස්වරූපය හැඩගැසීමට සමාන්තරවය. යුරෝපා ශිෂ්ටාචාරයේ සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස නව සමාජ සැකැස්මක් වශයෙන් සංහතිකත්වය සහ සංහතික සම්බන්ධතා වර්ධනය විය. ඊට සමගාමීව සංහතික මාධ්‍ය ගොඩනැගිණ. ශ්‍රී ලාංකික සමාජ සංවිධාන රටාවේ බලපැවැත්වූ විශේෂතා සහ මානව ද්‍රව්‍යයේ නිලීන යම් යම් ගතිලක්ෂණද පාදක කොටගෙන ශ්‍රී ලංකාව තුළ නව සමාජ සැකැස්මක් ලෙස සංහතිකත්වය හැඩගැසීමේ විශේෂතා, ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ සංකල්ප පද්ධතිය කෙරෙහි බලපා ඇති බව පැහැදිලිය.

යුරෝපයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ mass communication වශයෙන් ප්‍රචලිතවූ මෙම සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව තුළ ජනසන්නිවේදනය ලෙස නාමකරණය කැරේ.



නමුත් අපගේ මූලික ගැටලුව වන්නේ යුරෝපයේ mass ලෙස හඳුනාගන්නා නූතන යුගය තුළ සංවර්ධනය වූ මේ නව සමාජ සැකැස්ම හැඳින්වීම සඳහා සිංහල භාෂාවේ 'ජන' යන සංකල්පය භාවිත කිරීම කෙතෙක් දුරට විද්‍යාත්මකද යන්නය. 'ජන' යන සංකල්පය මානව වර්ගයාගේ සමාජීය පරිණාමයේදී විශේෂයෙන්ම මධ්‍යතන යුගයේදී හැඩගැසුණු මානවයාගේ පාදක කොටගත් සමාජ සැකැස්මකි. එය යුරෝපයේ 'Folk' ලෙස හඳුනාගත් අතර ඊට සිංහල භාෂාවෙන් 'ජන' යන්න භාවිත කැරේ.

මේ අනුව Folk (ජන) mass (ජන) භාවිත කිරීම සංකල්පීය සහ න්‍යායික පමණක් නොව ප්‍රායෝගික-පාරිභාෂික ක්ෂේත්‍රයේදී පැටලිලි සහගත බවක් සහ අවිනිශ්චිත බවක් ඇති කරන්නේය. මේ නිසා සිංහල භාෂාවේ ජන යන සංකල්පය ඓතිහාසික වශයෙන් එකිනෙකට වෙනස් සංකල්ප දෙකක් වන 'Folk" සහ 'Mass' හැඳින්වීම සඳහා භාවිත කිරීම යෝග්‍ය සහ විද්‍යාත්මක නොවන බව අවධාරණය කළ යුතුය. මේ නිසා mass යන සංකල්පය හැඳින්වීම සඳහා සිංහල භාෂා ව්‍යවහාරය තුළදී 'සංහතික' යන සංකල්පය වඩාත් යෝග්‍ය සහ විද්‍යාත්මක බව අපගේ වැටහීමයි.

නූතන ලෝක සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ 'mass, mass commanication, mass media, mass society, mas culture, mass war, mass revolution යන සංකල්පවල ඓතිහාසික සහ සමාජීය නිශ්චිත විශේෂතා ගැබ්ව ඇති අතර ඒ අනුව 'mass' යන්න අප අවබෝධ කරගත යුතුවන්නේ 'නූතන සමාජ සැකැස්මේ නව මාදිලියක් වශයෙනි.' නූතන ඉංග්‍රීසි පාරිභාෂික වෙනුවට සිංහල භාෂාවෙන් පිළිවෙළින් සංහතික, සංහතික සන්නිවේදනය, සංහතික මාධ්‍ය, සංහතික සමාජය, සංහතික සංස්කෘතිය, සංහතික සංග්‍රාමය, සංහතික විප්ලවය යොදාගත හැකි බව අපගේ අදහසයි. මෙයට අමතරව එකම අර්ථය සහිත සංකල්ප සඳහා විවිධ පාරිභාෂික භාවිතයද මඟහැරී යනු ඇත. නිදර්ශනයක් 'mass media සහ mass culture' යන්න දැනට භාවිත සිංහල යෙදුම් වන 'ජනමාධ්‍ය' සහ 'මහජන සංස්කෘතිය' නව භාවිතය තුළ 'සංහතික මාධ්‍ය' සංහතික සංස්කෘතිය ලෙස යෙදිය හැක. එසේම සම්මත

ලෝක ශාස්ත්‍රීය භාවිතය තුළ යෙදෙන folk song, folk dance, Folk arts සඳහා සිංහල පාරිභාෂික ලෙස පිළිවෙළින් ජන ගී, ජන නැටුම් සහ ජන කලා වශයෙන් පැහැදිලිව භාවිත කළ හැකිය.

අධ්‍යයනයේදී පෙනී යන මූලික කාරණයක් වූයේ 'ජන' යන සංකල්පය mass යන සංකල්පයෙන් අදහස් කරනු ලබන භාෂාවේදාත්මක හා සංඥාර්ථවේදී අර්ථය පමණක් නොව දාර්ශනික-ඥානවිභාත්මක මෙන්ම දේශපාලනික-සමාජවිද්‍යාත්මක අර්ථය ප්‍රකාශ කිරීම සඳහා සුදුසු නොවන බවයි. මේ නිසා mass යන සංකල්පයෙහි ගම්‍යමාන සියලු නෛසර්ගික ගුණාංග සහ ගතිලක්ෂණ සංයෝජනය කිරීමට හැකි සිංහල පාරිභාෂිතයක් වශයෙන් සංහතික යන සංකල්පය වඩාත් යෝග්‍ය බව පෙනීයයි.

ශ්‍රී ලංකාවේ සමාජ-මානව විද්‍යා සම්ප්‍රදාය තුළ විශේෂයෙන්ම සංහතික සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රයේ දශක හතරකට වඩා වූ ඉතිහාසය තුළ සංහතික (mass) යන සංකල්පය ගැඹුරින් සහ පුළුල්ව අධ්‍යයනය කොට නැත. මේ අනුව වසර 40කට ආසන්න කාලයක් ගතවුවත් අපේ ශාස්ත්‍රාලයීය අධ්‍යයනයට සංහතකික අනිශ්චිය (mass problematic) හරය අල්ලා ගෙන නැති බව පෙනේ.

සමකාලීන මානව වර්ගයාගේ සමාජ පරිණාමය ගෝලීය අවධියකට ප්‍රවිෂ්ට වී ඇති තත්ත්වයක් තුළ එහි සංහතික ස්වභාවය ගෝලීය පාරිමාණික තත්ත්වයක් අත්පත් කරගෙන තිබේ. මානව සංහතියේ සමකාලීන සමාජ පරිණාමය තුළ සංහතික සාධකයේ සක්‍රිය භූමිකාව එන්න එන්නම වර්ධනය වන්නේය. න්‍යායික පර්යාලෝකය සිට නිරීක්ෂණය කරන විට සමස්ත මානව වර්ගයාගේ ඉතිහාසික, සමකාලීන සහ අනාගත සමාජ පරිණාම ක්‍රියාවලියෙහි ජන සහ සංහතික යන ගුණාංගයන් සහ සම්බන්ධතා යම් යම් මට්ටමට සහ ප්‍රමාණයට අන්‍යොන්‍ය වශයෙන් සංයුක්තව ක්‍රියාත්මක වන බව පෙනේ. වර්තමාන ශිෂ්ටාචාරය තුළ සහ සමාජය තුළ වර්ධනය වන සංහතික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා සංහතිකවේදයක (massology) අවශ්‍යතාව තදින්ම දැනෙන්නේය. වර්තමානයේදී ගෝලීය පරිමාණිකව සංහතිකකරණය



(massification) සිදුවෙමින් පවතින අතර සියලු පන්ති ගැටුම් සංහතික ගැටුම් බවට පරිවර්තනයවෙමින් පවතින්නේය. පන්ති අරගලය සංහතික අරගලයක් බවට පරිවර්තනය වීම ජයග්‍රහණය කළහැක්කේ මනෝවිද්‍යාත්මක මාධ්‍යයන් මගින් වන අතර ඒ අතර සන්නිවේදන මාධ්‍යයන්ට හිමිවන්නේ ප්‍රථම ස්ථානයකි.[5] මෙය අද්‍යතන සංහතික මාධ්‍යයන්ගේ සමාජ භූමිකාව අවබෝධ කරගැනීම සඳහා අපව යොමු කරවන්නේය.

අප ගෙනහැර දක්වන ලද දෙවන කාරණාවට සම්බන්ධ තවත් ගැටලුසහගත සංකල්පීය පාරිභාෂිකයක් වශයෙන් journalism වෙනුවට භාවිත කැරෙන 'පුවත්පත් කලාව' දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ සමස්ත සංහතික මාධ්‍ය පද්ධතිය සේ ම පුවත්පතද ශ්‍රී ලාංකේය සමාජ-සංස්කෘතික සහ ප්‍රබුද්ධ- දෘෂ්ටිවාදී සම්ප්‍රදාය තුළ බිහිවී වර්ධනය වූවක් නොවන අතර එය යුරෝපීය ලිබරල් බුද්ධි සම්ප්‍රදාය මගින් අපට උත්තරාරෝපණය වූ යටත්විජිතවාදී සහ පශ්චාත් යටත්විජිතවාදී සංහතික විඥාපන මාධ්‍යයකි. යුරෝපයෙහි සංහතික තොරතුරු පාදක කොටගෙන දැනුවත් කිරීමේ දෛනික හා පාරිසාරික ස්වරූපයක් ලෙස යුරෝපී සමාජ-සංස්කෘතික සහ ප්‍රබුද්ධ-දෘෂ්ටිවාදී සන්දර්භයට අවියෝජනීය සම්බන්ධතාවක් තුළ jourrnalism යන භාවිතය බිහිවී වර්ධනය විය.

වර්තමාන ලෝක journalism විෂය ක්ෂේත්‍රයේ පරාමිතීන් සහ එහි සන්දර්භය අර්ථභාරය පාදකව ඇත්තේ මීට වසර 2070ක පමණ ඉහතදී රෝමයේ සමාජ-දේශපාලන ජීවිතයේ දෛනිකව සිදුවූ විශේෂ ගතික සහ චලන පිළිබඳව ප්‍රජාව සවිඥානික කිරීමේ සමාජ, දේශපාලනික සහ දෘෂ්ටිවාදී අවශ්‍යතාව පාදක කොටගෙන බව පෙන්වා දිය යුතුය. මේ දෛනික සහ පාරිසාරික ජීවිතයට වැදගත් වන දෛනික සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම රෝමවරුන් හඳුන්වන ලද්දේ Acta Diurna නමිනි. මෙහි Acta යන්න ප්‍රවෘත්ති ලෙසද Diurna යන්න දෛනික හෙවත් දිනපතා ලෙසද අර්ථ දැක්විය හැකිය. මේ අනුව Acta Diurna යනු දිනපතා ප්‍රවෘත්ති යන අර්ථය ගෙන දෙන්නේය. යුරෝපීය භාවිතය තුළ Journalism යන සංකල්පයේ මූල රූපය දෛනිකත්වය සමග සම්බන්ධ වන්නේය.

ප්‍රංශ භාෂාවේ journal යන්න දිනපොත වන අතර එය දෛනික වාර්තාකරණයේ ආකෘතියකි. විශේෂයෙන්ම මධ්‍යතන යුගයෙන් පසුව යුරෝපීය මිනිසාගේ කාලය කෙරෙහි වූ අනුස්ථාපනය වෙනස්වීම තවදුරටත් දෛනිකත්වයේ වැදගත්ම වර්ධනය විය. වර්තමානය අතික්‍රමණය කරමින් අනාගතය පිළිබඳ අදහස් යුරෝපීය විඥානය තුළ උත්කර්ෂණය වන්නට වූ අතර ඔවුන් දූන් වර්තමානයට වැදගත්වන්නේ වර්තමානය තුළ නිලීනගතික, චලන සහ ප්‍රවණතා අනාගතය වන බව අවබෝධ කරගත් නිසාය. වර්තමානයෙහි සිදුවන සංසිද්ධීන්, ක්‍රියාවලීන් සහ ප්‍රපංචයන් පිළිබඳව සවිඥානික වීමේ, දූනුවත්වීමේ ඒකායන පරාවර්තන, නිරූපණ ස්වරූපයක් වශයෙන් Journalsim අතිශයින්ම වැදගත් විය. මේ ආකාරයට Journalism යනු සංහතික මාධ්‍ය පාදක කොටගත් සංහතිකයන් සඳහා යොමුවූ සංහතික තොරතුරු ඒකරාශි කිරීමේ, අර්ථකථනය කිරීමේ, ප්‍රතිනිර්මාණය කිරීමේ සංස්කරණය කිරීමේ, බහුලීකරණය කිරීමේ සමාජ-දේශපාලන සහ ප්‍රබුද්ධ දෘෂ්ටිවාදී සමාජ ක්‍රියාකාරීත්වයකි. සිංහල භාෂාවේ මේ සඳහා දූනට භාවිත වන 'පුවත්පත් කලාව' යන යෙදුම විද්‍යාත්මක නොවන බවත් ඒ සඳහා වඩාත් යෝග්‍ය පාරිභාෂිකයක් ලෙස ප්‍රවෘත්තිකරණය යෝජනා කළ හැකිය.

යුරෝපීය භාෂා භාවිතයේ එන Journalism වෙනුවට සිංහල භාෂාවේද වෘත්තීය තලයේදී ප්‍රවෘත්තිකරණයද, ශාස්ත්‍රීය තලයේදී ප්‍රවෘත්තිවේදයද භාවිතය මගින් අදාළ සංකල්පයේ නිලීන ඥානවිභාගාත්මක, රූප ජනකවේදී සහ රූපවිචාරවේදී තත්ත්වයන්ට සමපාත වන බව අපගේ අදහසයි. වර්තමාන ව්‍යවහාරය තුළ 'ප්‍රවෘත්ති' යන සංකල්ප පටු, නොගැඹුරු සීමාවකට ඌනනය කර තිබේ. නමුත් මෙහි පළල් සහ ගැඹුරු අර්ථය තුළ දෛනික සත්තාවේ හැසිරීම ප්‍රකාශමාන වීම අර්ථවත් කරන්නේ.[6] වර්තමාන අර්ථයෙන් journalism හෙවත් ප්‍රවෘත්තිකරණය යනු සමාජය තුළ සාහිත්‍යයික, සමාජ, දේශපාලනික සහ දෘෂ්ටිවාදී ක්‍රියාකාරීත්වයක් ප්‍රකට කරන්නා වූ පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය සහ අන්තර්ජාලය හරහා සමාජමය වශයෙන් වැදගත්



තොරතුරු ඒකරාශි කිරීමේ, සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හුවමාරුවේ, බහුලීකරණයේ සහ ව්‍යාප්තිකරණයේ ස්වරූපයක් ලෙස ක්‍රියාත්මක වන දෛනිකත්වය සහ කාලීනත්වය පාදක කොට ගත් සමාජයීය භාවිතයකි.

ප්‍රවෘත්තිකරණය යනු මානව සංහතිය යථාර්ථය කෙරෙහි ගොඩනගා ගන්නා සම්බන්ධතාව පිළිබඳව වූ නව ස්වරූපයකි. එය පොදුවූද සාමුහික වූද බුද්ධිමය සහ නිර්මාණාත්මක ශ්‍රමය පාදක ප්‍රවෘත්තිකාරක (Journalist) ක්‍රියාකාරිත්වයකි, ක්‍රියාවලියකි. 'ප්‍රවෘත්තිකරණය සමාජය සඳහා' සියලු සත්‍ය සමස්තයක් ලෙස අනාවරණය කරන්නේ එක් පුද්ගලයකු සියල්ල කිරීමේ ආකාරයෙන් නොව ශ්‍රම විභජනය මත පියවරෙන් පියවර සිදුවන සාමූහික ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයක් ලෙසයැ'යි කාල් මාක්ස් නූතන සමාජයෙහි බුද්ධිමය සහ ප්‍රජානන භාවිතයක් ලෙස ප්‍රවෘත්තිකරණයේ ව්‍යුහය හරය දුටුවේය. මේ අනුව පුවත්පතකට සංස්කාරකත්වයක් මිස කර්තෘත්වයක් තිබිය නොහැකිය. නමුත් ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම සිංහල පුවත්පත්වල සිටින්නේ ප්‍රධාන කර්තෘවරයෙකි. එහෙත් මේ කර්මාන්තයේ ස්වභාවයට අනුව එහි සිටිය යුත්තේ ප්‍රධාන සංස්කාරකවරයෙකි. මෙයද ශ්‍රී ලාංකේය සංහතික මාධ්‍යවේදයේ වෘත්තීය තලය කේන්ද්‍ර කරගත් ගැටලුවකි.

සමහරවිට ශ්‍රී ලාංකේය ආර්ථික නිෂ්පාදන ක්ෂේත්‍රයේද දෛනික සමාජ ක්‍රියාකාරී ක්ෂේත්‍රයේද, බුද්ධිමය-දෘෂ්ටිවාදී ක්ෂේත්‍රයේද පැවති සරල, නොදියුණු, ඌන සංවර්ධිත සහ රේඛීය ශ්‍රම විභජනය මෙයට බලපාන ලද එක් හේතුවක් විය හැකි අතර දෙවන හේතුව ලෙස සංස්කෘතික-බුද්ධිමය ක්ෂේත්‍රයේ පැවති ආධිපත්‍යයේදී සහ අත්තනෝමතික ලක්ෂණ ගෙනහැර දක්විය හැක. 'සිංහල සමාජ ඉතිහාස විඥානයේ ප්‍රධාන ධාරාව. සැකසීමට උපස්ථම්භක වූ සම්භාව්‍ය ඉතිහාස ආඛ්‍යාන සම්ප්‍රදානය වී ඇත්තේ රාජ්‍ය කේන්ද්‍රීයමය, ප්‍රභූ කේන්ද්‍රීයමය, වංශ කේන්ද්‍රීයමය... ඓතිහාසික බලවුවමනාවන්ට අනුකූලවය.' ක්‍රමානුකූලව යුරෝපීය යටත්විජිත ආධිපත්‍යයේ බලපෑමත් සමග ශ්‍රී ලංකාවේ හැඩගැසෙමින් තිබූ මධ්‍යම පන්තිය සිය සමාජ-දේශපාලන සහ සංස්කෘතික බලය

අත්පත් කරගැනීමේ සහ වර්ධනය කරගැනීමේ වඩාත්ම ප්‍රබල දෘෂ්ටිවාදී මාධ්‍ය බවත් ඔවුන් දක්කේ පුවත්පත් බව සඳහන් කළ යුතුය. එක් අතකින් යුරෝපීය සාහිත්‍යයික සහ දෘෂ්ටිවාදී විද්‍යාපතිත සම්ප්‍රදායන්ගේ ප්‍රාථමික අවබෝධය තුළද අනෙක් අතින් යුරෝපීය ප්‍රකාශන විශේෂයෙන්ම සාහිත්‍යයික, සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථී ලේඛනවේදිය සහ ප්‍රවෘත්තිකරණ ස්වරූපයන්ගේ ආභාසය යටතේ අපේ රටේ ප්‍රවෘත්තිකරණය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් නාමකරණය වූයේ සරල, ප්‍රාථමික, ප්‍රපංචවාදී ස්වරූපයකිනි.

ඇත්ත වශයෙන්ම යුරෝපා ශිෂ්ටාචාරය තුළ ශතවර්ෂ ගණනාවක සිට වර්ධනය වූ මේ නව සාහිත්‍යයික-දෘෂ්ටිවාදී භාවිතය ඒ රටවල සමාජ-බුද්ධිමය ශ්‍රම විභජන මාදිලියට අනුකූලව සකස් වී වර්ධනය වී පුළුල් සමාජගත ප්‍රබුද්ධ හා නවීකාරක ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. නමුත් ප්‍රවෘත්තිකරණය නව සමාජ-දේශපාලනික සහ සාහිත්‍යයික-දෘෂ්ටිවාදී භාවිතයක් ලෙස ශ්‍රී ලංකාව සඳහා ආගන්තුක හා අලුත් දෙයක් විය. අප රටේ නූතන සන්නිවේදන සහ මාධ්‍ය මාදිලියේ ව්‍යුහය කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවක් ගත්තේය. එමෙන්ම සමාජ සම්බන්ධතාවන්ගේ සහ චින්තනයේ කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවද නූතන සන්නිවේදන සහ ඒ සංහතික මාධ්‍ය හා ප්‍රවෘත්තිකරණය මත කර්තෘ ආකල්පය ව්‍යාප්තවීම කෙරෙහි බලපාන ලද ප්‍රබල සාධකයක් ලෙස සැලකිය හැකිය.

ආරම්භක ලාංකේය පුවත්පත් කර්තෘ කේන්ද්‍රීය ප්‍රවණතාවක් අත්පත් කරගැනීමට ඉහත කෙනෙහැර දක්වන ලද සාධක සහ කොන්දේසිවලට අමතරව ලාංකේය ප්‍රබුද්ධ සහ ආධ්‍යාත්මික සම්ප්‍රදායේ ඌන සංවර්ධිතභාවය ද බලපා තිබේ. පුවත්පත් නවීකරණය විය යුතු අන්දම ඔහු (ඩී.ඊ. කුරුකුලසූරිය කර්තෘ) ඥාතාර්ථ ප්‍රදීපයා දැන නොසිටියා පමණක් නොව පරණ ගණිවිය අතාරින්නට කැමති වූයේද නැත.''[9] මෙය ශ්‍රී ලංකාවේ බුද්ධිමය සහ නිර්මාණාත්මක ක්ෂේත්‍රයේ කාලීන නොදියුණු ශ්‍රම විභජන ලක්ෂණ සහ එහි ගතානුගතික පසුගාමී තත්ත්වයන් පෙන්වන්නකි.

පුවත්පත ස්ථාපනය වන සහ සංවර්ධනය වන යටත්විජිත සහ



පශ්චාත් යටත්විජිත යථාර්ථයේ ධනේශ්වර සම්බන්ධතා පද්ධතිය තුළ ස්ථාන ගතවීම කෙරෙහි දක්වන ලද්දේ මන්දගාමී ස්වභාවයකි. සාම්ප්‍රදායික සමාජ සම්බන්ධතා පද්ධතිය බිඳ වැටෙමින් වාණිජවාදී සංකීර්ණ සම්බන්ධතා හැඩගැසෙමින් තිබිණ. මෙය වටහා ගැනීමට තරම් වර්ධනය වූ බුද්ධියක් පොදු ලාංකිකයා සතුව නොතිබුණි.''[10] යුරෝපීය රටවලද ප්‍රවෘත්තිකරණය, සංහතික මාධ්‍යයේ පමණක් නොව වෙනත් විෂයයන්ගේද සංකල්පීය ව්‍යුහය වර්ධනය වීම අදාළ සමාජයේ වර්ධනය සහ ඊට සමගාමීයව සිදුවූ අදාළ විෂයික වාක්කෝෂීය වර්ධනයන් සමග සිදුවී ඇති බව පෙනේ. යම් සමාජයක භාෂා විෂයික සංකල්ප හැඩගැසීමෙහිලා එම සමාජ මානව ද්‍රව්‍යයේ බලපෑම නියමානුකූලතාවකි.'' ශාස්ත්‍රීය කාරණා සඳහා පමණක් නොව දිනපතා ප්‍රවෘත්ති සහ දැන්වීම් පළකිරීම සඳහා සුදුසු මාධ්‍යයක් ලෙස සිංහල ගද්‍ය භාෂාව සකස් කර ගැනීමේ කාර්යය මුල්කාලීන පත්‍ර කර්තෘවරුන් අතින් සිදුවී ඇත. ''ලංකාවේ පුවත්පත් බිහිවූ මුල් වකවානුවල සිටම ඊට සරිලන භාෂා ස්වරූපයක්, ශෛලියක් ගොඩනගා ගැනීමේ ප්‍රයත්නයන් සිදුවී තිබෙන බව එහි ඉතිහාසය පිරික්සීමේදී පැහැදිලි වන්නේය. නමුත් ප්‍රවෘත්තිකරණය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඒ පිළිබඳව කල්පනා කිරීමක් හෝ අවධානයක් නොතිබූ බව සඳහන් කළ යුතුය. ප්‍රවෘත්ති පත්‍ර සඳහා උචිත ලේඛන රීතියක් සකසා ගැනීමට මෙකල පත්‍ර කර්තෘවරුන් දරූ උත්සාහය විශේෂයෙන් කැපී පෙනේ.''[11] මෙය සාහිත්‍යයික හා භාෂා භාවිතයේ අභ්‍යන්තර සංවර්ධනය නාමයන් මගින් තත්ත්වාරෝපණය කරනු ලබන කාරණයක් ලෙස දක්විය හැකි අතර ප්‍රවෘත්තිකරණ සහ සංහතික මාධ්‍ය විෂයික සංකල්ප හැඩගැසීම ඉතා පුළුල් සහ ගැඹුරු සමාජ-ඓතිහාසික සහ ශාස්ත්‍රාලයීය පරිස්ථිතියක් මත තීරණය වන්නකි.'' සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීමේදී භාෂා විෂයික නිර්දේශාත්මක ආකල්ප (prescriptive attitudes) එම භාෂා සමාජයේ ඉතිහාසය හා අනෙකුත් සමාජ සංස්කෘතික දේශපාලනික සාධක අනුව තීරණය වෙයි.''[12]

ලංකාව තුළ 19 වන සියවසේ යුරෝපීය යටත්විජිත බහුතරය ඔස්සේ උත්තරාරෝපිත වූ ධනේශ්වර ප්‍රවෘත්තිකරණය, සංහතික

මාධ්‍ය පිළිබඳ නව භාවිතය පැවති ලාංකේය සාම්ප්‍රදායික වැඩවසම් සමාජ සංස්කෘතික හා දේශපාලනික පරිසරය තුළට විකරණය වූයේ නූතන මුද්‍රණ ධනවාදයට සරිලන ආකාරයට නොව පූර්ව ගතානුගතික වැඩවසම් සමාජයෙහි ආධිපත්‍යය දරන ලද සාහිත්‍යයික සහ දෘෂ්ටිවාදී සම්ප්‍රදායේ ඉදිරි වර්ධනයක් ලෙසය. එම ක්ෂේත්‍රයෙහිවූ ප්‍රධාන කර්තෘකයා සහ කර්තෘත්වයද මේ යථාර්ථය කෙරෙහි නව ස්වරූපයක් වූ ධනේශ්වර ප්‍රවෘත්තිකරණය සහ සංහතික මාධ්‍යකරණ ක්‍රියාවලියටද ආදේශ කළේය.

ශ්‍රී ලංකාවේ සන්නිවේදන, ප්‍රවෘත්තිකරණ සංහතික මාධ්‍යය අධ්‍යයනය සහ ඒ පිළිබඳ ආකල්පය තාක්ෂණිකවාදී සහ අකෘතිකවාදී රාමුවක් තුළ හැඩගැසී තිබීමද එහි ගැටලුවක් වශයෙන් සැලකිය හැකිය. බටහිර ලෝකය තුළ පවා ආරම්භයේදී සන්නිවේදනයට අදාළ න්‍යායික අදහස් නිර්මාණය වූයේ සහජාසාත්මක තලයේ වන අතර ඒ සම්බන්ධව බරපතළ සහ ගැඹුරු අධ්‍යයනයන් ආරම්භවන්නේ 1920 සහ 30 ගණන්වලදීය. එය විශේෂයෙන්ම සිදුවූයේ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රයේය. සන්නිවේදන මාධ්‍යයන්ගේ ශීඝ්‍ර වර්ධනය ප්‍රවෘත්තිකරණය සහ තොරතුරු කෙරෙහි විද්‍යාත්මක අවධානය වර්ධනයවීමට බලපෑවේය. ආරම්භක අවධියේ සිට සන්නිවේදන න්‍යාය පිළිබඳ එකිනෙකට වෙනස් න්‍යායික ප්‍රවේශයන් දෙකක් ගොඩ ගැසුණේය. ඉන් එක් ප්‍රවේශයක් තාක්ෂණිකවාදී වූ අතර අනෙක මානවවාදී විය. මේ ප්‍රවණතා දෙක නියෝජනය කරන ලදි. පර්යේෂකයන් අතර වූ දුර්වල සම්බන්ධතාව හේතු කොටගෙන සන්නිවේදනය පිළිබඳ පොදු සහ සාකල්‍යමය සංකල්පීය ප්‍රවේශයක් ගොඩනගා ගැනීමට අපොහොසත් වූ බව ඉතිහාසය පෙන්වා දෙයි. මේ පිළිබඳව පුළුල් විග්‍රහයකට යෑමට මෙය අවස්ථාවක් නොවන නිසා එය ලාංකේය සන්නිවේදන සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයනයේ සංකල්පීය ව්‍යුහයේ තාර්කික පදනමේ මුඛ්‍ය ප්‍රවණතාව පෙන්වාදීමට සීමාවන්නේය.

ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයනයේදී එහි ක්‍රියාවලිය විග්‍රහ කිරීමේදී බහුල ලෙස භාවිත කරන හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය මගින් සන්නිවේදන



ක්‍රියාවලියේ දෘෂ්ටිවාදී සහ සමාජීය ගතිලක්ෂණ පිළිබඳව කිසිම අවධානයක් යොමු නොකරන සරල රේඛීය ආකෘතියකි. මෙය සන්නිවේදන ක්‍රියාවලියේ අභ්‍යන්තර සංවර්ධනයන්ගේ පැහැදිලි කිරීමකට සීමා වන අතර එම ක්‍රියාවලියේ අභ්‍යන්තර සීමා අතික්‍රමණය කරන්නා වූද, සන්නිවේදන අභ්‍යන්තර ක්‍රියාවලියෙන් බාහිරව පවතින්නාවූද ඉතා වැදගත් ප්‍රශ්නයකින් වන සංහතික මාධ්‍ය සංදේශයේ අරමුණු පිළිබඳව අවධානය හෝ අධ්‍යයනය නොකැරේ. සමාජ-දේශපාලන සහ සංහතික-දෘෂ්ටිවාදී ක්‍රියාවලීන් තේරුම් ගැනීමේදී ඉතා වැදගත්වන්නේ ඍජු ලෙසම ප්‍රකට වුවමනාවන් ඉදිරිපත් කරන්නේ කවුරුද? යන්න එතරම් වැදගත් නැති අතර ඉතා වැදගත්වන්නේ අදාළ අදහස්, වුවමනාවන් කාහටද වාසි ගෙනදෙන්නේ යන්නය. දේශපාලනයේදී වැදගත්වන්නේ මතය, අදහස් ඉදිරිපත් කරන්නා නොව එම මත අදහස යෝජනා වාසිවන්නේ කාටද යන්න බවය.[14] මේ ලැස්වේලියානු සන්නිවේදන ආකෘතියේ ඇති අඩුපාඩුව, දුර්වලතාව සංහතික සන්නිවේදන ක්‍රියාවලියේ අවසාන හරය අනාවරණය කරගැනීම සඳහා විශාල බාධාවකි. අපගේ අදහසට අනුව ලැස්වේලියානු සන්නිවේදන ආකෘතිය අංගසම්පූර්ණ වීම සඳහා කවුරු, කුමන ප්‍රතිඵලයක් සඳහා, කුමන මාර්ගයකින් කාට කුමක් කියයිද යන පංච විධ අංගවලට අමතරව කුමන අරමුණකින්ද යන හයවැනි අංගයක් ද එකතු කළ යුතුය.

ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ආධිපත්‍යය දරන ලද ආකෘතිකවාදී සහ තාක්ෂණිකවාදී ප්‍රවණතාව එය හුදු අදහස්, හැඟීම් සම්ප්‍රේෂණය කිරීමේ සහ හුවමාරුවේ මාදිලියක් ලෙසට සීමාවී තහවුරු විය. නිදර්ශනයක් වශයෙන් ෂැනොන් හා වීවර් 1948දී ඉදිරිපත් කළ ගණිත විද්‍යාත්මක සන්නිවේදන ආකෘතිය දැක්විය හැකිය. මෙය සන්නිවේදනය පිළිබඳ සාමස්තික න්‍යායක් වර්ධනය වී නොතිබූ කලක සන්නිවේදන න්‍යාය පිළිබඳ පැවතියේ සමාකලනාත්මක (Summative) ප්‍රවේශක අර්ථකථනයකි. එනම් සන්නිවේදන වස්තූන්, ක්‍රියාවලින් සහ ඊට සරිලන දැනුම් සංකීර්ණයකි. ශ්‍රී ලාංකේය සන්නිවේදනයේ න්‍යායික අධ්‍යයන ක්ෂේත්‍රය තුළ මෙම ප්‍රවේශය

ප්‍රමුඛ වූ අතර සන්නිවේදනය ඒකීය, මූලික විෂයක් සහ බහුමානීය පද්ධතියක් ලෙස සැලකීමේ දෙවන ප්‍රවේශය තුළ අර්ථකථනය කිරීම නොකැරේ. මෙම දෙවන ප්‍රවේශය තුළ වෙනත් විද්‍යාවන්ගේ න්‍යායික ආහාෂය තුළින් ලබා ගන්නා දැනුම හා අත්දැකීම් සන්නිවේදනයේ පොදු න්‍යාය වර්ධනයට තුඩු දෙන්නේය. මෙහිදී න්‍යායික සංශ්ලේෂණය සිදුවන්නේ සමාජ-සන්නිවේදනාත්මක විද්‍යාවන් පමණක් නොව ස්වාභාවික විද්‍යා සහ විද්‍යාත්මක-තාක්ෂණික දැනුමත් සමගය. මෙය ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ අවධානයට යොමු නොවූ එහි වර්ධනයේ ඓතිහාසික සීමාවන් සනිටුහන් කරන අංශයකි.

වර්තමාන ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය සමකාලීන යුරෝපීය සහ ඇමරිකානු අදාළ ක්ෂේත්‍රයට සාපේක්ෂව විමර්ශනය කරන විට විශාල වෙනසක් දැකිය හැකිය. සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය පසුගිය දශක කිහිපය තුළ යුරෝපීය රටවල ශීඝ්‍ර ලෙස සංවර්ධනය වූ අතර එය විවිධ ප්‍රවණතා සහ ගතික ඔස්සේ ගමන් කොට ඇත. අද එය බහුවිෂයික, පාරවිෂයික, අන්තර් විෂයික පරාසයන් කරා පැතිරුණු එසේම පුළුල් සහ ගැඹුරු, සිරස් සහ තිරස් චලනයන් ඔස්සේ අධ්‍යයනය කරනු ලැබේ. මේ අනුව සන්නිවේදනය සහ සංහතික මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ විද්‍යාත්මක පරාමිතීන් සහ එහි දෘෂ්ටිවාදය සම්බන්ධව අවධානය යොමු කිරීමේදී පෙනීයන්නේ මෙය ශ්‍රී ලාංකේය සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ සුසමාදර්ශක විස්ථාපන (Paradigmatic shift) සන්ධිස්ථානයක් සනිටුහන් කරන අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

විශේෂයෙන්ම පසුගිය දශක දෙකකට ඉහතදී ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ න්‍යායික සහ සංකල්පීය සීමා අතික්‍රමණය කරමින් එය නව අවධියකට වර්ධනයවීම සනිටුහන් කරන අතර සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ආධිපත්‍යය දැරූ දෘෂ්ටිවාදය සහ ආකල්පය උන්මූලවාදී ලෙස විපර්යාසයට ලක්වෙමින් පවතින්නේය.



සමකාලීන ශ්‍රී ලාංකේය සන්නිවේදන සංහතික මාධ්‍යවේද සහ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රයේ අධ්‍යයන සහ පර්යේෂණ සීමා සහ ඒවා අද්‍යතන ලෝක සන්නිවේදන, සංහතික මාධ්‍යවේද සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයන සහ පර්යේෂණ තත්ත්වයන් දක්වා සංවර්ධනය වී නොතිබීම ප්‍රබල ගැටලුවකි. සන්නිවේදනයේ අධ්‍යයනයේ ආරම්භක ඉතිහාසයේදී පැවති සන්නිවේදනය හුදු අදහස් සම්ප්‍රේෂණයේ සිට අදහස් හුවමාරු කරගැනීමේ මාදිලියක, අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයේ මාදිලියක, පොදු භාවයක් සහ අවබෝධයක් නිර්මාණය කිරීමේ භාවිතයක සිට වර්තමානයේදී සන්නිවේදනය යනු සමාජ ක්‍රියාවලියේ පදනම සකසන්නා වූ මානව සමාජ සන්තානේ ස්වරූපයකි. 'සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේදය ප්‍රවෘත්තිකරණය සමාජ යථාර්ථය නිර්මාණය කිරීමේ, සුරක්ෂිත කිරීමේ, නවීකරණය කිරීමේ, ප්‍රතිනිර්මාණය කිරීමේ සහ අනුකරණය කිරීමේ පදනම් සමාජ ක්‍රියාවලියකි.''[15] සන්නිවේදනය සමාජය සංයුක්ත කරන සංරචක නිර්මාණය කිරීමේ ක්‍රියාවලියකි. එය හුදු දැනට අප තුළ තිබෙන අදහස්, හැඟීම්, අර්ථ මතවාද සම්ප්‍රේෂණය කිරීමේ සහ හුවමාරු කරගැනීමේ මාධ්‍යයක් නොව ඒවා හැඩ ගස්වන සහ නිර්මාණකරණ ක්‍රියාවලියකි. වර්තමාන සංහතික මාධ්‍ය ක්‍රියාවලිය දෙස අප අවධානය ප්‍රධාන වශයෙන් යොමුවිය යුත්තේ සමාජ-දේශපාලනික ක්‍රියාවලියක් ලෙස වටහා ගැනීම සඳහාය. විශේෂයෙන්ම වර්තමාන ලෝක සංහතික මාධ්‍යවේද සහ සන්නිවේදන අධ්‍යයනය විවිධ ශාස්ත්‍රාලයීය ගුරුකුල සහ ප්‍රවණතා ඔස්සේ වර්ධනයවෙමින් පවතී. පද්ධති න්‍යාය, සමාජ අභිසංස්කරණවාදය, සමාජ නිර්මාණකවාදය, ප්‍රජානන මනෝවිද්‍යාව, සමාජ විචාරාත්මක චින්තනය, සංස්කෘතික අධ්‍යයනය, සංඥාර්ථවේදය, සමාජභාෂාවේදය, මානවවංශවේදීය සන්නිවේදනය, සම්භාෂණ විශ්ලේෂණය, කතිකා විශ්ලේෂණය, උපයෝගයතාවාදය, අර්ථ කළමනාකරණ සහ සමායෝජිත මතිජ්කත්වවේදය, විචාරාත්මක සමාජ විද්‍යාව, සමාජ අන්තර් ක්‍රියාකාරීත්වය සහ ස්ත්‍රීවාදය ඒ අතර සමහරකි. මෙම සියලු සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ගුරුකුල සහ ප්‍රවණතා සිය ක්‍රමවේදය, න්‍යායික සහ සංකල්පීය

පදනම් ලෙස විවිධ පර්යේෂණ සම්ප්‍රදායයන් භාවිත කළද සන්නිවේදනය සහ සංහතික මාධ්‍යවේදය පිළිබඳ ගැටලුවේදී ඔවුන් දරන පොදු දාර්ශනික සහ න්‍යායික ආස්ථානයන්ගේ ඒකාබද්ධතාවක් පෙන්නුම් කරන්නේය. සංහතික මාධ්‍ය සහ ප්‍රවෘත්තිකරණ ක්ෂේත්‍රය තුළ 20 සියවස අවසාන දශකයේදී 'සන්නිවේදනය කෙරෙහි සමාජයීය ප්‍රවේශ'[16] නමින් එම පොදු දාර්ශනික ඒකීයත්වය නිර්මාණය විය.

මේ අනුව පෙනීයන්නේ ලෝක සන්නිවේදන සහ සංහතික මාධ්‍යවේද අධ්‍යයන ක්ෂේත්‍රය සංවර්ධනය වන්නේ හුදකලා ශික්ෂණ මාර්ගයක් වශයෙන් නොව පොදු දාර්ශනික සහ න්‍යායික සංකල්පීය පරිගතයක ආභාසය ලබමින් හා නිරතුරුවම ඉන් පෝෂණයවෙමින් බවය.

අද්‍යතන ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයෙහි න්‍යායික, සංකල්පීය, මූලධර්මීය සීමා විස්තාරණය විය යුතුය, ගැඹුරු විය යුතුය. ඒ පිළිබඳව පවතින සාම්ප්‍රදායික දෘෂ්ටිවාදය සහ ආකල්පය වෙනස් විය යුතුය. ඒ අනුව ශ්‍රී ලාංකේය සන්නිවේදන සහ ප්‍රවෘත්තිකරණ අධ්‍යයනය විස්තරාත්මක ප්‍රවේශය ව්‍යුහාත්මක ප්‍රවේශයක් දක්වාද, ආකෘතිකවාදී මාදිලිය සංදර්භීය මාදිලියක් දක්වාද, යාන්ත්‍රික තාක්ෂණිකවාදී ප්‍රවේශය කෘත්‍යවාදී ප්‍රවේශයක් දක්වා ද, පාරිශුද්ධවාදී/සදාචාරවාදී ආකල්පය විද්‍යාත්මක ආකල්පයක් දක්වාද භාෂාවේද කේන්ද්‍රිය ප්‍රවණතාව සංහතිකවේදී කේන්ද්‍රිය ප්‍රවණතාවක් දක්වාද, ව්‍යාජ නිර්දෘෂ්ටිවාදී/ස්වාධීන ආස්ථානය දෘෂ්ටිවාදී/පක්ෂවාදී ආස්ථානයක් දක්වාද සමාකලනවාදී ශෛලිය සාමාස්තිකවාදී/ඓන්ද්‍රිය ශෛලියක් දක්වාද වෙනස් විය යුතු වන්නේය.

1. Marx, Engels, The German, Ideology, progress publishersy, Moscow, 1975
2. විපුධර් වීරසිංහ, මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, 2011.



3. රෝහණ ලක්ෂ්මන් පියදාස (සංස්) සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහය, දෙවන වෙළුම 2003.
4. Blumer, H The mass, the public and public opinion in A.M. Lee (ed) New outlines of the principles of sociology, New York. Barrchs and Nobel 1939
5. Serge moskovici, The Age of the crowd, a historical treatise on mass psychology, Cambridge University press, 1985.
6. සංක්ෂිප්ත සිංහල, ශබ්දකෝෂය, ද්විතීය භාගය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, 2009.
7. කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 1.
8. සුනිල් විජේසිරිවර්ධන, පුරවැසි මංපෙත්-ගැටුම්වේදය ආශ්‍රිත සංස්කෘතික හා දාර්ශනික අවලෝකන, Flict, කොළඹ 2010.
9. ඩී.එෆ්. කාරියකරවන, දසක සතක මතක, කාරියකරවන ප්‍රකාශන, මහරගම, 1998.
10. ගාමිණී දැල බණ්ඩාර, සිංහල පුවත්පත් ප්‍රභවය සහ අභිවර්ධනය, සම්භාව්‍ය ප්‍රකාශන, කැලණිය, 1993.
11. සඳගෝමි කෝපරහේවා, විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය සමාජවාග් විද්‍යාත්මක අධ්‍යයනයක්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන 2010.
12. එම
13. එම
14. වී.අයි. ලෙනින් සම්පූර්ණ කෘති වෙළුම 23, පිටුව 61.
15. Pearce, W.B. and pearce, K.A. Extending the Theory of coordinated management of meaning, Through a community Dialogue process Communication Theory 2000.
16. Craig R.T.W. Leeds-Hurwatz(ed) social approaches to Communication New York, 1995.

විපුධර් වීරසිංහ:

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයාය. ජනමාධ්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.